# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1905/38 - 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා - 2015.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳව ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතුය.

හේරත් යාපා,
සභාපති,
රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

රබර් පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1945 ජූලි මස 21 වැනි දින අංක 9436 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.


1A - G 21205 — 51 (2015/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *II* වන කොටස

### *මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

**සේවක පන්තිය**

*II වැනි ශ්‍රේණිය :*

මීටි ගැලවීම, පලුදු කපා දැමීම හා බාක් කැපීම, පුස්කාපු රබර් සේදීම හා නැවත දුම් ගැස්සීම, පැස්වලටත්, තරාදිවලටත්, ගබඩාවේ වෙනත් තැන්වලටත් ගෙනයාම ඇතුලුව කම්කරුවන් කරන සාමාන්‍ය වැඩ, ගොඩ ගැසීම, බේල් කිරීම සඳහා රබර් කුත්තු කිරීම සහ එතිම පැසේ දමා තද කිරීම, වලයන් වලින් හා කම්බි වලින් බැඳීම, ජුටෙසින් කවර කැපීම, පින්තාරු කිරීම, වේලීම, ගොඩගැසීම, ලකුණු කිරීම, විශේෂ ඇහිරීම සඳහා ජුටෙසින්වල හුණු ගෑම, රබර් බේල් ජුටෙසින්වලින් ඔතා මැහුම් දැමීම, මීටි බිම දැමීම, ගබඩා සහ කාණු පිරිසිදු කිරීම හා පිස දැමීම යන මේවායේ නිරත කම්කරුවෝ.

*මධ්‍යම ශ්‍රේණිය :*

කිරීම, වර්ග කිරීම හා තේරීම, ප්‍රෙස් ක්‍රියා කරවීමේ වැඩ යන මේවායේ නිරත කම්කරුවෝ.

*I වැනි ශ්‍රේණිය :*

පැටවීම, බෑම හා මීටි ගෙන යාම, අඩුක්කු කිරීමෙහි නිරත කම්කරුවෝ සහ තේරීමේ නිරත කම්කරුවෝ.

*මුරකරුවන්*

| *වසර* | *II වැනි ශ්‍රේණිය රු. ශ* | *මධ්‍යම ශ්‍රේණිය රු. ශ* | *1 වැනි ශ්‍රේණිය රු. ශ* | *මුරකරුවන් රු, ශ* |
|---|---|---|---|---|
| 1 වසර | 11,212.50 | 11,700.00 | 12,187.50 | 11,212.50 |
| 2 වසර | 11,312.50 | 11,825.00 | 12,337.50 | 11,312.50 |
| 3 වසර | 11,412.50 | 11,950.00 | 12,487.50 | 11,412.50 |
| 4 වසර | 11,512.50 | 12,075.00 | 12,637.50 | 11,512.50 |
| 5 වසර | 11,612.50 | 12,200.00 | 12,787.50 | 11,612.50 |
| 6 වසර | 11,712.50 | 12,325.00 | 12,937.50 | 11,712.50 |
| 7 වසර | 11,812.50 | 12,450.00 | 13,087.50 | 11,812.50 |
| 8 වසර | 11,912.50 | 12,575.00 | 13,237.50 | 11,912.50 |
| 9 වසර | 12,012.50 | 12,700.00 | 13,387.50 | 12,012.50 |
| 10 වසර | 12,112.50 | 12,825.00 | 13,537.50 | 12,112.50 |
| 11 වසර | 12,212.50 | 12,950.00 | 13,687.50 | 12,212.50 |
| 12 වසර | 12,312.50 | 13,075.00 | 13,837.50 | 12,312.50 |
| 13 වසර | 12,412.50 | 13,200.00 | 13,987.50 | 12,412.50 |
| 14 වසර | 12,512.50 | 13,325.00 | 14,137.50 | 12,512.50 |
| 15 වසර | 12,612.50 | 13,450.00 | 14,287.50 | 12,612.50 |

03 - 880/1

## පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

### ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2015. අප්‍රේල් මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

හේරත් යාපා,
සභාපති,
ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්දා වූ තීරණවල II වැනි කොටස වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තවදුරටත් වෙනස් කළ යුතු ය.

*(අ)* ක්‍රියාකාරී සේවාවන් : ආරක්ෂක නිලධාරීන්, ආරක්ෂක භටයින්, මුරකරුවන්, පැට්රෝල්මන් හෝ කිනම් නමින් හැඳින්වුවද ක්‍රියාකාරී සේවාවන්හි යෙදෙන සේවකයින්.

*(ආ)* පාලනමය සේවාවන් : ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්ය භාර නිලධාරීන්, මුර සේවා භාර සුපවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

*අවම මාසික වේතනය*

| *සේවා වසර* | *ක්‍රියාකාරී සේවාවන්* <br> *රු. ශ.* | *පාලනමය සේවාවන්* <br> *රු. ශ.* |
|---|---|---|
| 1 වසර | 11,320.00 | 11,940.00 |
| 2 වසර | 11,420.00 | 12,090.00 |
| 3 වසර | 11,520.00 | 12,240.00 |
| 4 වසර | 11,620.00 | 12,390.00 |
| 5 වසර | 11,720.00 | 12,540.00 |
| 6 වසර | 11,820.00 | 12,690.00 |
| 7 වසර | 11,920.00 | 12,840.00 |
| 8 වසර | 12,020.00 | 12,990.00 |

*අවම මාසික වේතනය (සම්බන්ධිතයි)*

| *සේවා වසර* | *ක්‍රියාකාරී සේවාවන්* *රු. ශ.* | *පාලනමය සේවාවන්* *රු. ශ.* |
|---|---|---|
| 9 වසර | 12,120.00 | 13,140.00 |
| 10 වසර | 12,220.00 | 13,290.00 |
| 11 වසර | 12,320.00 | 13,440.00 |
| 12 වසර | 12,420.00 | 13,590.00 |
| 13 වසර | 12,520.00 | 13,740.00 |
| 14 වසර | 12,620.00 | 13,890.00 |
| 15 වසර | 12,720.00 | 14,040.00 |
| 16 වසර | 12,820.00 | 14,190.00 |
| 17 වසර | 12,920.00 | 14,340.00 |
| 18 වසර | 13,020.00 | 14,490.00 |
| 19 වසර | 13,120.00 | 14,640.00 |
| 20 වසර | 13,220.00 | 14,790.00 |
| 21 වසර | 13,320.00 | 14,940.00 |
| 22 වසර | 13,420.00 | 15,090.00 |
| 23 වසර | 13,520.00 | 15,240.00 |
| 24 වසර | 13,620.00 | 15,390.00 |
| 25 වසර | 13,720.00 | 15,540.00 |
| 26 වසර | 13,820.00 | 15,690.00 |

03 - 880/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2015. අප්‍රේල් මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

හේරත් යාපා,
සභාපති,
ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12617 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 දින අංක 1789/19 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වන කොටස*

ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තයේ නියුක්ත සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය සහ අවම මාසික වේතන ප්‍රමාණය පහතින් දක්වා ඇත.

***සේවකයින්ගේ පන්තිය***

*පුහුණු කම්කරුවෝ I වැනි ශ්‍රේණිය* :

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (යන්ත්‍රයෙන් ), පෝරණුවලට ගින්දර දමන්නෝ (දාහකයෙන්)

*පුහුණු කම්කරුවෝ II වැනි ශ්‍රේණිය* :

ප්‍රෙස් යන්ත්‍රයට මැටි සපයන්නෝ (අතින් ), පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමේ සහ කඳු ගැසීමේ යෙදෙන්නෝ, තෝරා වෙන්කරන්නෝ

*අර්ධ පුහුණු කම්කරුවෝ* :

දබර කරකවන්නෝ, කට්ටි කපන්නෝ, උළු කට්ටවලට තෙල් ගාන්නෝ සහ මට්ටම් කරන්නෝ, සාහින්නෝ, අමු උළු තෝරා වෙන් කරන්නෝ, ගෙනයාම සඳහා උළු වාහනවලට ගොඩ ගසන්නෝ

*නුපුහුණු කම්කරුවෝ* :

මැටි කලවම් කිරීමේ සහ පෑහීමේ යෙදී සිටින කම්කරුවෝ, ට්‍රක් පුරවන්නෝ, මැටි කරුවෝ, කට්ටි ගෙනයන්නෝ, යන්ත්‍රයෙන් මිශ්‍ර කිරීමේ දී හා අත් ගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, රාක්කවලට උළු ගොඩගැසීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු හිරු රැසින් වේලීමේ යෙදී සිටින කම්කරුවෝ, උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, අමු උළු තෝරා වෙන්කරන්නන්ගේ අත් උදව්කරුවෝ, දර අදින්නෝ, අත් ගසන යන්ත්‍රයට මැටි සපයන්නෝ, උළු කඳු ගසන්නෝ, ප්‍රෙස් යන්ත්‍රවලට හෝ ගබඩාවේ අනෙක් කොටස්වලට මැටි කට්ට ගෙන යන්නෝ, පිළිස්සීම සඳහා පෝරණුව තුළ උළු පැටවීමෙහි සහ කඳු ගැසීමෙහි යෙදෙන්නන්ගේ අත් උදව්කරුවෝ.

**අවම දෛනික වේතන ප්‍රමාණය**

| *I තීරය* *සේවකයාගේ පන්තිය* | *II තීරය* *ප්‍රමාණය* *රු. ශ.* |
|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 452 50 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 430 00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 405 00 |
| නුපුහුණු කම්කරුවෝ | 380 00 |

**අවම මාසික වේතන ප්‍රමාණය**

| සේවකයාගේ පංතිය | 1 වසර<br>රු. ශ. | 2 වසර<br>රු. ශ. | 3 වසර<br>රු. ශ. | 4 වසර<br>රු. ශ. | 5 වසර<br>රු. ශ. |
|---|---|---|---|---|---|
| පුහුණු කම්කරුවෝ I ශ්‍රේණිය | 11,312.50 | 11,487.50 | 11,662.50 | 11,837.50 | 12,012.50 |
| පුහුණු කම්කරුවෝ II ශ්‍රේණිය | 10,750.00 | 10,900.00 | 11,050.00 | 11,200.00 | 11,350.00 |
| අර්ධ පුහුණු කම්කරුවෝ | 10,125.00 | 10,250.00 | 10,375.00 | 10,500.00 | 10,625.00 |
| නුපුහුණු කම්කරුවෝ | 9,500.00 | 9,600.00 | 9,700.00 | 9,800.00 | 9,900.00 |

03 - 880/3

---

## පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

((136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2015. අප්‍රේල් මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

හේරත් යාපා,
සභාපති,
රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව,

2015 මාර්තු මස 10 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

රබර් (ටයර් නිෂ්පාදන හා නැවත පිරවීම ඇතුළුව) ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව 1968 දෙසැම්බර් මස 06 වැනි දින අංක 14831 දරන *ගැසට්* පත්‍රයේ පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූද සහ අවසන් වරට 2013 ජනවාරි මස 03 දින අංක 1791/33 දරන අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයෙහි II වන කොටසේ 'මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය' යන ශීර්ෂය යටතේ දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

*II* වන කොටස

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

| සේවා වසර | නුපුහුණු<br>රු. ශත | අඩ පුහුණු<br>රු. ශත | පුහුණු<br>රු. ශත | වෘත්තීය පුහුණු හදාරන්නන් ආධුනිකයන්<br>රු. ශත |
|---|---|---|---|---|
| 1 වසර | 11,815.00 | 12,220.00 | 12,625.00 | 8,020.00 |
| 2 වසර | 11,915.00 | 12,345.00 | 12,775.00 | 8,220.00 |
| 3 වසර | 12,015.00 | 12,470.00 | 12,925.00 | 8,420.00 |
| 4 වසර | 12,115.00 | 12,595.00 | 13,075.00 | 8,620.00 |
| 5 වසර | 12,215.00 | 12,720.00 | 13,225.00 | |
| 6 වසර | 12,315.00 | 12,845.00 | 13,375.00 | |
| 7 වසර | 12,415.00 | 12,970.00 | 13,525.00 | |
| 8 වසර | 12,515.00 | 13,095.00 | 13,675.00 | |
| 9 වසර | 12,615.00 | 13,220.00 | 13,825.00 | |
| 10 වසර | 12,715.00 | 13,345.00 | 13,975.00 | |
| 11 වසර | 12,815.00 | 13,470.00 | 14,125.00 | |
| 12 වසර | 12,915.00 | 13,595.00 | 14,275.00 | |
| 13 වසර | 13,015.00 | 13,720.00 | 14,425.00 | |
| 14 වසර | 13,115.00 | 13,845.00 | 14,575.00 | |
| 15 වසර | 13,215.00 | 13,970.00 | 14,725.00 | |
| 16 වසර | 13,315.00 | 14,095.00 | 14,875.00 | |
| 17 වසර | 13,415.00 | 14,220.00 | 15,025.00 | |
| 18 වසර | 13,515.00 | 14,345.00 | 15,175.00 | |
| 19 වසර | 13,615.00 | 14,470.00 | 15,325.00 | |
| 20 වසර | 13,715.00 | 14,595.00 | 15,475.00 | |
| 21 වසර | 13,815.00 | 14,720.00 | 15,625.00 | |
| 22 වසර | 13,915.00 | 14,845.00 | 15,775.00 | |
| 23 වසර | 14,015.00 | 14,970.00 | 15,925.00 | |
| 24 වසර | 14,115.00 | 15,095.00 | 16,075.00 | |
| 25 වසර | 14,215.00 | 15,220.00 | 16,225.00 | |

03 - 880/4

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2015. අප්‍රේල් මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

හේරත් යාපා,<br>
සභාපති,<br>
කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1959 අප්‍රේල් මස 29 වන දින අංක 11732 දරන ලංකාණ්ඩුවේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කළින් කළට වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2014.07.24 වැනි දිනැති 1872/31 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම් වලින් වෙනස් කරන ලද්දාවූ ද එකී තීරණ එම උපලේඛනයේ II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කළ යුතු ය.

*II කොටස*

I තීරයෙන් දැක්වෙන නිශ්චිත කැලි මිම්මේ හා කාල මිම්මේ වැඩ ප්‍රමාණයන්ට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II තීරයෙහි දක්වා ඇති අනුරූප ප්‍රමාණයෙන් විය යුතුය.

| *I වන තීරය*<br>*විස්තරය* | *II වන තීරය*<br>*අවම වේතන ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|
| <u>කාල මිම්මේ වැටුප් - දෛනික</u> | |
| නුහුරු පැහීම, අගල් දැමීම හා තට්ටු සකස් කිරීම වල් නෙලීම, ඉලුක් තණ ඉවත් කිරීම හා මායිම් එළි කිරීම (එක් දිනකට) | 520.00 |
| කම්කරුවෙකුට : | |
| <u>කුරුඳු තැලීම - දෛනික</u> | |
| කම්කරුවෙකුට | 550.00 |
| <u>කැලි මිම්මේ වැටුප් - ඒකකයකට</u> | |
| නුහුරු පැහීම - හෙක්ටයාරයකට | 11,400.00 |
| අගල් දැමීම - 18" X 18" කානු දිග මීටර් 10 ට | 216.00 |
| වාර්ෂික වල් නෙලීම - හෙක්ටයාරයකට | 10,200.00 |

03 - 880/5

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි ඇති පරිද්දෙන් වෙනස් කිරීමට සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
සාත්තු නිවාස ව්‍යාපාර කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

සාත්තු නිවාස ව්‍යාපාරය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1974 ක් වූ මාර්තු මස 22 වැනි දින අංක 104 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, කලින් කලට වෙනස් කරන ලද්දා වූද, අවසන්වරට 2013 මාර්තු මස 07 වැනි දින අංක 1800/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

***කම්කරුවාගේ පන්තිය***

*I වැනි ශ්‍රේණිය*

මේට්‍රන්වරියන්, ඇපොතිකරිවරුන්.

*II වැනි ශ්‍රේණිය*

ඖෂධවේදීන්, සාත්තුකාර සහෝදරියන්, රසායනාගාර ශිල්පීන්, එක්ස්රේ කාර්මිකයන්.

*III වැනි ශ්‍රේණිය*

(අ) සාත්තු සේවිකාවන්, වින්නඹුවන්, ගබඩා භාරකරුවන්
(ආ) පුහුණුව ලබන සාත්තු සේවිකාවන්

1 වැනි වසරේ පුහුණුව සඳහා
2 වැනි වසරේ පුහුණුව සඳහා
3 වැනි වසරේ පුහුණුව සඳහා

*IV වැනි ශ්‍රේණිය*

ලිපිකරුවන්, යතුරු ලේඛකයින්, අමුත්තන් පිළිගන්නන්, දුරකථන ක්‍රියාකරුවන්, අයකැමියන්

*V වැනි ශ්‍රේණිය*

උපස්ථායකයින්, ඩිස්පෙන්සර්වරුන්, ශල්‍ය ඩ්‍රෙසර් වරුන්, ස්ටුවර්ඩ් වරුන්, ඕවර්සියර්වරුන්, වාට්ටු ලිපිකරුවන්, කෑම වට්ටෝරු ලිපිකරුවන්.

*VI වැනි ශ්‍රේණිය*

ඔඩර්ලිවරුන්, පියන්වරුන්, අරක්කැමියන්, මුරකරුවන්, කසළ ශෝධක කම්කරුවන්.

*VII වැනි ශ්‍රේණිය*

ලිනන් කාමරවල උපස්ථායකයින්, කම්කරුවන්, උද්‍යාන කම්කරුවන්, අමදින්නන්, පැන්ට්‍රි බෝයිස්

පුහුණුව ලබන සාත්තු සේවිකාවන් සම්බන්ධයෙන් "වසර" යන්නෙන් අදහස් කරනුයේ "දොලොස් මසක සේවා කාලයකි".

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

| සේවා වර්ෂය | I වැනි ශ්‍රේණිය රු. ශත | II වැනි ශ්‍රේණිය රු. ශත | III වැනි ශ්‍රේණිය (ඒ) රු. ශත | III වැනි ශ්‍රේණිය (බී) රු. ශත | IV වැනි ශ්‍රේණිය රු. ශත | V වැනි ශ්‍රේණිය රු. ශත | VI වැනි ශ්‍රේණිය රු. ශත | VII වැනි ශ්‍රේණිය රු. ශත |
|---|---|---|---|---|---|---|---|---|
| 1 වන වර්ෂය | 13,970.00 | 13,670.00 | 13,162.50 | 8,275.00 | 12,755.00 | 12,350.00 | 11,950.00 | 11,645.00 |
| 2 වන වර්ෂය | 14,220.00 | 13,895.00 | 13,362.50 | 8,425.00 | 12,930.00 | 12,500.00 | 12,075.00 | 11,745.00 |
| 3 වන වර්ෂය | 14,470.00 | 14,120.00 | 13,562.50 | 8,575.00 | 13,105.00 | 12,650.00 | 12,200.00 | 11,845.00 |
| 4 වන වර්ෂය | 14,720.00 | 14,345.00 | 13,762.50 | | 13,280.00 | 12,800.00 | 12,325.00 | 11,945.00 |
| 5 වන වර්ෂය | 14,970.00 | 14,570.00 | 13,962.50 | | 13,455.00 | 12,950.00 | 12,450.00 | 12,045.00 |
| 6 වන වර්ෂය | 15,220.00 | 14,795.00 | 14,162.50 | | 13,630.00 | 13,100.00 | 12,575.00 | 12,145.00 |
| 7 වන වර්ෂය | 15,470.00 | 15,020.00 | 14,362.50 | | 13,805.00 | 13,250.00 | 12,700.00 | 12,245.00 |
| 8 වන වර්ෂය | 15,720.00 | 15,245.00 | 14,562.50 | | 13,980.00 | 13,400.00 | 12,825.00 | 12,345.00 |
| 9 වන වර්ෂය | 15,970.00 | 15,470.00 | 14,762.50 | | 14,155.00 | 13,550.00 | 12,950.00 | 12,445.00 |
| 10 වන වර්ෂය | 16,270.00 | 15,695.00 | 14,962.50 | | 14,330.00 | 13,700.00 | 13,075.00 | 12,545.00 |

03 - 880/6

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් මෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බැව් එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා වර්ෂ 2015 අප්‍රේල් මස 02 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මෙම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

පිගන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන ලදුව, 1999 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 1099/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2013 ජනවාරි 03 වැනි දින අංක 1791/33 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරනු ලැබූ තීරණ, එම උපලේඛනයට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*සේවකයන්ගේ පංතිය*

**පුහුණු :**

අංශ නියාමකයින්, විවිධ යන්ත්‍ර ක්‍රියා කරවන්නන් මෝස්තර අඳින්නන්, චාර්ජ් හැන්ඩර්වරුන්, දහන යන්ත්‍ර ක්‍රියාකරුවන්, උඳුන් ක්‍රියා කරවන්නන්, ජ්‍යෙෂ්ඨ ලිෆ්ට් ඔපරේටර්, අච්චු ශිල්පීන්, පර්යේෂණ සහයකයන්, මූර්ති ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්, හරි වැරදි බලන්නන්, විදුලි කාර්මිකයින්.

**අර්ධ පුහුණු :**

සහකාර අච්චු ශිල්පීන්, වර්ණ ගන්වන්නන් (ස්ප්‍රේ කරන්නන් සහ ඩිපර්ස්) තෝරන්නන්, කණිෂ්ට ලිෆ්ට් ඔපරේටර්, පොලිෂ් කරන්නන්. අසුරන්නන්, නිෂ්පාදන සුද්ද කරන්නන්, ස්ටිකර් අලවන්නන්, ෂවල් ලෝඩර් ඔපරේටර්, සහකාර යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකරු, උඳුන් සහායක ක්‍රියාකරු.

**නුපුහුණු :**

පිරිසිදු කරන්නන්, අත් උදවුකරුවන්, සාමාන්‍ය වැඩකරුවෝ, වතුවැඩ කරන්නන් සහ වෙනත් අනුශාංගික සේවාවල නිරතවන්නන්.

**ආධුනිකයින් :**

අවුරුදු දෙකක පුහුණු කාල සීමාවකට යටත් ව විවිධ කාර්යයන්හි වැඩ ඉගෙන ගන්නා අය.

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *පුහුණු රු. ශත* | *අර්ධ පුහුණු රු. ශත* | *නුපුහුණු රු. ශත* | *ආධුනිකයින් රු. ශත* |
|---|---|---|---|---|
| 1 වසර | 12,360.00 | 11,520.00 | 10,765.00 | 6,550.00 |
| 2 වසර | 12,510.00 | 11,645.00 | 10,865.00 | 6,650.00 |
| 3 වසර | 12,660.00 | 11,770.00 | 10,965.00 | |
| 4 වසර | 12,810.00 | 11,895.00 | 11,065.00 | |
| 5 වසර | 12,960.00 | 12,020.00 | 11,165.00 | |

03 - 880/7

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1979 අප්‍රේල් මස 27 වැනි දින අංක 34 දරන *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන්වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ පහත සඳහන් පරිදි තවදුරටත් වෙනස් කළ යුතු ය.

හෝටල් සහ හෝජන සැපයීමේ කර්මාන්තයෙහි නියුක්ත I වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම මාසික වේතන ප්‍රමාණය II වන කොටස එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතු ය.

*I කොටස*

***සේවකයන්ගේ පන්තිය***

*I වැනි ශ්‍රේණිය*

ඇසිස්ටන් රූම්බෝයි, ක්ලොක් රූම් ඇටෙන්ඩන්ට්, ක්ලොක් රූම් නැනී, කම්කරු - නිදන කාමර ක්ලීනර්ස්,ලවුන්ජ් ලේබර්ස්, කසල ශෝධක (නිදන කාමර ), කසල ශෝධක කම්කරු, ඔෆිස් බෝයි, කාර්යාල කම්කරු, කම්කරු - ගබඩා, සයිකල් ඔඩ්ලි, මුළුතැන්ගෙයි සහායක, පිඟන් සෝදන්නා, කම්කරු මුළුතැන්ගෙයි, පෝටර්, පැන්ට්‍රිබෝයි, උදව්කරු, ප්ලේට් රූම් බෝයි, ග්ලාස් රූම් බෝයි, සිල්වර් රූම් බෝයි, බාර් ලේබර්ස්, යුටිලිටි වර්කර්ස්, වතු කම්කරු/උදව්කරු, නුපුහුණු කම්කරු (නඩත්තු), මුළුතැන්ගෙයි පිරිසිදු කරන්නා.

*II වැනි ශ්‍රේණිය*

රූම් බෝයි, හවුස්මන්, රූම් මේඩ්, ලිනන් රූම් ඇටෙන්ඩන්ට්, රූම් නැනී, පියන්වරු, මැසෙන්ජර්, චැකර්වරු, බෙල්බෝයි, පේජ්බෝයි, සෝපානකරු, ඩෝමන්, බැගේජ්ලිෆ්ට් ඔපරේටර්වරු, පාස් ලිෆ්ට් ඔපරේටර්, සහකාර වේටර්, සහකාර ස්ටුවර්ඩ්, බස් බෝයි, බාර්ටෙන්ඩර් සහකරු, සහකාර බාර්මන්, බිලියඩ් මාකර්, ලයිෆ් ගාඩ්, ලොන්ඩරි ඇසිස්ටන්, ගාඩ්නර්, පූල් ඇටෙන්ඩන්ට්, අර්ධ පුහුණු කම්කරු (නඩත්තු )

*III වැනි ශ්‍රේණිය*

සිම්ස්ට්‍රස් ටේලර්, සම්බාහකයෝ, ලිපිකරු III වැනි ශ්‍රේණිය, ගබඩා සහායක, රියදුරුවරු, බාර්කැෂියර්, බිල් ලිපිකරු, සාමාන්‍ය ලිපිකරු, පෞද්ගලික ලිපිකරු ස්නැක් බාර්, අරක්කැමි, රසකැවිලි සාදන්නෝ, සහකාර අරක්කැමි, තර්ඩ් කිචන් කොමිස්, සහකාර බක්කරේ. පැන්ට්‍රිමන්, අරක්කැමි III වැනි ශ්‍රේණිය, ඇසිස්ටන් බෙල් කැප්ටන්, හෝල් පෝටර්, වේටර්, බාර්මන්, ස්ටුවර්ට්, බාර් වේටර්, බාර් ස්ටුවර්ඩ්, සිකියුරිටි ගාඩ්, උද්‍යාන පාලක, පුහුණු ( නඩත්තු ) කම්කරු, බාර්ටෙන්ඩර්.

*IV වැනි ශ්‍රේණිය*

හෙල්ත් ක්ලබ්, පිළිගැනීමේ නිලධාරී, ලිපිකරු II වැනි ශ්‍රේණිය, සහකාර ගබඩාකරු, ගබඩා ලිපිකරු, ඇසිස්ටන්ට් නයිට් ඔඩිටර්, ටයිම් කීපර්, කාඩෙක්ස් ඇසිස්ටන්වරු, ගිණුම් ලිපිකරු, සහකාර පොත් තබන්නා,කොස්ට් ක්ලාක්, ක්‍රෙඩිට් ක්ලාක්, විකුණුම් ලෙජර් ලිපිකරු, වැටුප් ලිපිකරු, යතුරු ලියන්නා, මුදල් අදියරු, ජෙනරල් ඇසිස්ටන්, පෞද්ගලික සහායක, සහකාර ප්‍රධාන අරක්කැමි, සෙකන්ඩ් කිචන් කොමිස්, බක්කරේ, අංශ ප්‍රධාන අරක්කැමි, II පන්තියේ අරක්කැමි, දුරකථන ක්‍රියාකරු, පිළිගැනීමේ නිලධාරී, බෙල් කැප්ටන්, ප්‍රධාන පෝටර්, රූම් සර්විස්, ඕඩර් ටේකර්, බට්ලර්වරු, හෙඩ් බාර්මන්, හෙඩ් බාර් කීපර්, හෙඩ් වේටර්, හෙඩ් ස්ටුවර්ඩ්, කැප්ටන් හොස්ටේස්, හෙඩ් පැන්ට්‍රිමන්, ටී මේකර්, සිකියුරිටි ලීඩර්, සීනියර් ලොන්ඩරි ඇසිස්ටන්.

*V වන ශ්‍රේණිය*

ෆ්ලෝ සුපර්වයිසර්වරු, ලිනන්රූම් සුපර්වයිසර්වරු, හෙදි, ඇසිස්ටන් හවුස් කීපර්, ලිපිකරු I ශ්‍රේණිය, ගබඩා භාරකරු, ප්‍රධාන ගිණුම් ලිපිකරු, සරප්, පොත් තබන්නා, නයිට් ඔඩිටර්, ආදායම් ගණන් පරීක්ෂක, ලඝුලේඛක, ප්‍රධාන ලිපිකරු, ප්‍රධාන අයකැමි, ගණන් පරීක්ෂක, සහකාර මිළදී ගැනීමේ නිලධාරී, චීෆ් ටයිම් කීපර්, කිචන් ස්ටුවර්ඩ් සුපර්වයිසර්, ෆස්ට් කිචන් කොමිස්, ප්‍රධාන අරක්කැමි, මණ්ඩලීය අරක්කැමි, රෙස්ටුරන්ට් අරක්කැමි, ෆ්‍රන්ට් ඔෆීස් ක්ලාක්, ගුවන් තොටුපල නියෝජිත, ප්‍රධාන පිළිගැනීමේ නිලධාරී, ප්‍රධාන ටෙලෙක්ස් ක්‍රියාකරු, ප්‍රධාන දුරකථන ක්‍රියාකරු, රිසවේෂන් ක්ලාක්, පරිපාලක ඩිස්ක්ජෝකි, කළමනාකරු, සිකියුරිටි ෆස්ට් ලීඩර්, උද්‍යාන පරිපාලක,ඉංජිනේරු චාර්ජ් හැන්ඩ්, පිහිනුම් තටාක පරිපාලක.

## *II කොටස*

### වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණ

සේවක පන්තිය

| *සේවක වසර* | *ශ්‍රේණිය I*<br>*රු. ශත.* | *ශ්‍රේණිය II*<br>*රු. ශත.* | *ශ්‍රේණිය III*<br>*රු. ශත.* | *ශ්‍රේණිය IV*<br>*රු. ශත.* | *ශ්‍රේණිය V*<br>*රු. ශත.* |
|---|---|---|---|---|---|
| 1 වසර | 11,590.00 | 12,095.00 | 12,600.00 | 13,105.00 | 13,610.00 |
| 2 වසර | 11,690.00 | 12,220.00 | 12,750.00 | 13,280.00 | 13,810.00 |
| 3 වසර | 11,790.00 | 12,345.00 | 12,900.00 | 13,455.00 | 14,010.00 |
| 4 වසර | 11,890.00 | 12,470.00 | 13,050.00 | 13,630.00 | 14,210.00 |
| 5 වසර | 11,990.00 | 12,595.00 | 13,200.00 | 13,805.00 | 14,410.00 |
| 6 වසර | 12,090.00 | 12,720.00 | 13,350.00 | 13,980.00 | 14,610.00 |
| 7 වසර | 12,190.00 | 12,845.00 | 13,500.00 | 14,155.00 | 14,810.00 |
| 8 වසර | 12,290.00 | 12,970.00 | 13,650.00 | 14,330.00 | 15,010.00 |
| 9 වසර | 12,390.00 | 13,095.00 | 13,800.00 | 14,505.00 | 15,210.00 |
| 10 වසර | 12,490.00 | 13,220.00 | 13,950.00 | 14,680.00 | 15,410.00 |

03 -880/8

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බතික් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, 1979 අගෝස්තු මස 03 වැනි දින අංක 48 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් මා වෙත පවරනු ලැබූ බලය ප්‍රකාරව කම්කරු කොමසාරිස් හේරත් යාපා වන මම බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය එම ආඥාපනතේ 33 (2) වගන්තිය යටතේ තීරණය කිරීමට අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

යෝජිත තීරණයට දැක්වෙන විරෝධතා 2015 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
කම්කරු කොමසාරිස්.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාලමිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව 1979.11.30 වන දින අංක 64/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන්වරට 2013 ජනවාරි 03 දින අංක 1791/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ.

බතික් කර්මාන්තයෙහි නියුක්ත I තීරයෙහි සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වන තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| | *I වැනි තීරය*<br>*සේවක පන්තිය* | *II වැනි තීරය*<br>*වැඩ කරන දවසක් සඳහා වූ වේතන ප්‍රමාණය*<br>*රු. ශ.* |
|---|---|---|
| *(අ)* | චිත්‍ර ශිල්පී, මෝස්තරකරු | 603 75 |
| *(ආ)* | තම්බන්නෝ, සායම් පොවන්නෝ | 517 50 |
| *(ඇ)* | මදින්නෝ, පිටපත් ගන්නෝ, ඉටි කරන්නෝ | 474 50 |

*වැඩ කරන සාමාන්‍ය දවස*

වැඩ කරන සාමාන්‍ය දවස් (කෑම ගැනීම හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව ) වැඩ කරන සාමාන්‍ය දවසක් සමන්විත වන පැය ගණන පහත සඳහන් පරිදි විය යුතුයි.

| | | |
|---|---|---|
| *(අ)* | සෙනසුරාදා හැර ඕනෑම දවසක | පැය 09 |
| *(ආ)* | සෙනසුරාදා දවසක | පැය 06 |

03 - 880/9

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 දින මධ්‍යාහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාර ගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

***උපලේඛනය***

පුවත්පත් කලාවේදී කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1986 ජූලි මස 25 වැනි දින අංක 411/19 දරන *ගැසට් පත්‍රයෙහි* පළ වූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තා වූ ද, අවසන්වරට අංක 1800/27 දරන 2013 මාර්තු මස 07 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද වූ නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයෙහි II කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

*විශේෂ ශ්‍රේණිය*

නියෝජ්‍ය කර්තෘ, සම කර්තෘ, විශේෂ ශ්‍රේණියේ කර්තෘ, කර්තෘ (දිනපතා)

*1 වන ශ්‍රේණිය*

ව්‍යාපාරික කර්තෘ, ප්‍රධාන උප කර්තෘ, විශේෂාංග ප්‍රධානීන්, විදේශීය ප්‍රවෘත්ති කර්තෘ, විචිත්‍රාංග කර්තෘ,ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘ, ප්‍රවෘත්ති කර්තෘ, ක්‍රීඩා කර්තෘ, කන්තා පිටු සංස්කාරිකා, කර්තෘ (සතිපතා) චිත්‍ර කතා කර්තෘ

*II වන ශ්‍රේණිය*

සහකාර කර්තෘ, ප්‍රධාන කැමරා ශිල්පීන්, විශේෂාංග නියෝජ්‍ය අංශ ප්‍රධානීන්, විශේෂාංග ලියන්නන්, සහකාර කතුවැකි රචකයින් , පුස්තකාලයාධිපතීන්, උප කර්තෘ, විකට චිත්‍ර ශිල්පීන්, භාෂා පරිවර්තකයින්, ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පීන්, චිත්‍ර ශිල්පීන්.

*III වන ශ්‍රේණිය*

සහකාර පුස්තකාලයාධිපතීන්, වාර්තාකරුවන්, කැමරා ශිල්පීන්, කණිෂ්ඨ උප කර්තෘ, සෝදුපත් කියවන්නන්.

**මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| සේවා වර්ෂය | විශේෂ ශ්‍රේණිය<br>රු. ශ | I වන ශ්‍රේණිය<br>රු. ශ | II වන ශ්‍රේණිය<br>රු. ශ. | III වන ශ්‍රේණිය<br>රු. ශ. |
|---|---|---|---|---|
| 1 වසර | 22,080.00 | 18,570.00 | 17,555.00 | 16,735.00 |
| 2 වසර | 22,430.00 | 18,870.00 | 17,805.00 | 16,935.00 |
| 3 වසර | 22,780.00 | 19,170.00 | 18,055.00 | 17,135.00 |
| 4 වසර | 23,130.00 | 19,470.00 | 18,305.00 | 17,335.00 |
| 5 වසර | 23,480.00 | 19,770.00 | 18,555.00 | 17,535.00 |
| 6 වසර | 23,830.00 | 20,070.00 | 18,805.00 | 17,735.00 |
| 7 වසර | 24,180.00 | 20,370.00 | 19,055.00 | 17,935.00 |
| 8 වසර | 24,530.00 | 20,670.00 | 19,305.00 | 18,135.00 |
| 9 වසර | 24,880.00 | 20,970.00 | 19,555.00 | 18,335.00 |
| 10 වසර | 25,230.00 | 21,270.00 | 19,805.00 | 18,535.00 |
| 11 වසර | | 21,570.00 | 20,055.00 | 18,735.00 |
| 12 වසර | | 21,870.00 | 20,305.00 | 18,935.00 |
| 13 වසර | | 22,170.00 | 20,555.00 | 19,135.00 |
| 14 වසර | | 22,470.00 | 20,805.00 | 19,335.00 |
| 15 වසර | | 22,770.00 | 21,055.00 | 19,535.00 |

III වැනි ශ්‍රේණියේ පුහුණුවන්නන් පළමු වසර - රු. 11,960.00

03 - 880/10

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව ) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පවරා ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුලුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව)
සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව) සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1968 ජුනි මස 14 වැනි දින අංක 14806 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයේ දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරනු ලද්දාවූ ද, හා අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන තීරණ එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

*II කොටස*

විස්කෝතු හා රසකැවිලි (චොකලට් සෑදීම ඇතුළුව ) සෑදීමේ කර්මාන්තයේ නියුක්ත පහතින් දක්වා ඇති සේවක පන්තිවලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම මාසික වේතන ප්‍රමාණයන් පිළිවෙලින් යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට සහ අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවන්ට අදාළ වන පරිදි පිළිවෙලින් I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

***සේවක පන්ති***

*"ඒ " ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම* :

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ* :

පදම් පිටි අනන බාල්දි සහ භාජන පිරිසිදු කිරීම ඇතුළුව අවශ්‍ය ද්‍රව්‍ය කිරා බැලීම හා මැනීම, රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම, සාර වර්ග හා පාට වර්ග දැමීම හා මිශ්‍රණ යන්ත්‍රවලට ද්‍රව්‍ය පිරවීම ඇතුළුව පදම් පිටි ඇනීම සම්බන්ධ කාර්යයන් කපන යන්ත්‍රය සම්බන්ධ කාර්යයන්, කැපීමේ හා තෙරපීමේ කටයුතු සම්බන්ධ කාර්යයන්, පෝරණුවලට තැටි දමන්නන්ගේ හා පෝරණු සහායකවරුන්ගේ කාර්යයන් ඇතුළුව විස්කෝතු පිච්චීම, අට්ටි ගැසීම යන්ත්‍ර සම්බන්ධ කාර්යයන්.

*(ආ) රසකැවිලි සෑදීම :*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ* :

අවශ්‍ය ද්‍රව්‍යයන් උණු කිරීම, "හොට් ටේබල්ස් " වලින් "බැච්" නොහොත් කැටි කළ මිශ්‍රණය එහා මෙහා මාරු කිරීම සම්බන්ධ කාර්යයන් "කූල් " ටේබල්ස් වලින් "බැච්" නොහොත් කැටි කළ මිශ්‍රණය එහා මෙහා මාරුකිරීම සම්බන්ධ කාර්යයන් "බැච්ෆීඩර්" යන්ත්‍ර සම්බන්ධ කාර්යයන් "බැච්" නොහොත් කැටි කළ මිශ්‍රණය බන්දේසිවලට හිස් කිරීම සම්බන්ධ කර්යයන් "කපන සහ ඔතන යන්ත්‍රය" සම්බන්ධ කාර්යයන් "ටැබ්ලටිං යන්ත්‍රය" සම්බන්ධ කාර්යයන් "සෙන්ටර් මැනුෆැක්චරිං යන්ත්‍රය" හා සම්බන්ධ කාර්යයන් "කැටකරන යන්ත්‍රය" සම්බන්ධ කාර්යයන්.

*"බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම* :

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ* :

පිටි සහ සීනි, මාජරින්, එළවළු තෙල්, ග්ලූකෝස් ලෙසිටයින්, සාර වර්ග, කොකෝවා, පිටි, චීස්, මෝල්ට්, මිල්ක් පවුඩර්, රසායන ද්‍රව්‍ය, බටර් ඇමෝනියා බේකිං පවුඩර්, බිත්තර හා වෙනත් ද්‍රව්‍යයන් බාරගැනීම හා ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, විස්කෝතු සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය පැටවීම, බෑම සහ ගෙනයාම සම්බන්ධ කාර්යයන්, පිටි හැලීම සම්බන්ධ කාර්යයන්, මිශ්‍ර පදම් පිටි, භාජන කපන මේසයෙහි ඇතිරීම, දිගහැරීම හා තුනී කිරීම, විස්කෝතු ටින් හා පැකට් ගෙනයෑම, අට්ටි ගැසීම, පැටවීම සහ බෑම ආදී කටයුතු සම්බන්ධ කාර්යයන්, පැකට්වල ඇහිරීම, තාප මුද්‍රාතැබීම, කුඩා පෙට්ටිවල ඇහිරීම සහ කුඩා පෙට්ටි ඇලවීම.

*(ආ) රසකැවිලි සෑදීම*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ* :

ග්ලූකෝස්, සීනි සාර වර්ග, කොකෝ ඇට, මිල්ක් පවුඩර්, එළවළු, බටර්, ජෙලටීන්, රසායන ද්‍රව්‍ය හා රස වර්ග ඇතුළු අවශ්‍ය ද්‍රව්‍යයන් බාරගැනීම සහ ගබඩා කිරීම සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන් කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොපි සම්බන්ධ කාර්යයන්, අවශ්‍ය ද්‍රව්‍යයන්, කිරා බැලීම, මැනීම සහ මිශ්‍ර කිරීම, ටොපි, චොක්ලට් හා රසකැවිලි කිරා බැලීම සහ ඇහිරීම, බන්දේසිවල රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේ දී රසකැවිලි එකතු කිරීම හා රසකැවිලි තාප කරන කාමරයේ දී වේලීම, ජෙලටින් හා පාට වර්ග යෙදීම, ජුජුබ්ස් බන්දේසිවල එකතු කිරීම, කිරා බැලීම සහ ඇහිරීම, රසකැවිලි සහ චොකලට් එතීම, ලේබල් ගැසීම සහ ඇහිරීම සහ රසකැවිලි සෑදීමට අදාළ වැඩවලට සම්බන්ධ වූ හෝ ඊට ආනුශාංගික වූ වෙනත් කාර්යයන්.

*"සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)*

*(අ) විස්කෝතු සෑදීම -*

*පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :*

පදම් වූ පිටි කැට කුඩු කිරීම සම්බන්ධ කාර්යයන්, පිච්චූ විස්කෝතු නිවීමේ රාක්කයෙන් එහා මෙහා ගෙනයාම, තැටි සහ භාජන සේදීම සහ පිරිසිදු කිරීම, කැපූ විස්කෝතු එකතු කිරීම සහ පිළියෙල කිරීම සහ විස්කෝතු සෑදීමට අදාළ වැඩවලට සම්බන්ධ හෝ ඊට ආනුශංගික වූ වෙනත් කාර්යයන්.

*(ආ) රස කැවිලි සෑදීම :*

පහත සඳහන් කාර්යයන්හි යෙදී සිටින කම්කරුවෝ :
රසකැවිලි, චොක්ලට් සහ ටොපි තේරීම, බැග් මුද්‍රා තැබීම, චොකලට් අච්චු පිරවීම, අච්චුවලින් චොකලට් ගැලවීම.

වගුව 1

**අවම මාසික වේතන ප්‍රමාණය**

යන්ත්‍රානුසාරයෙන් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට

| කම්කරුවාගේ පන්තිය | 1 සේවා වසර | 2 සේවා වසර | 3 සේවා වසර | 4 සේවා වසර | 5 සේවා වසර |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| "ඒ" ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 13,045.00 | 13,195.00 | 13,345.00 | 13,495.00 | 13,645.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 13,045.00 | 13,195.00 | 13,345.00 | 13,495.00 | 13,645.00 |
| "බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 12,545.00 | 12,670.00 | 12,795.00 | 12,920.00 | 13,045.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 12,545.00 | 12,670.00 | 12,795.00 | 12,920.00 | 13,045.00 |
| "සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 12,045.00 | 12,145.00 | 12,245.00 | 12,345.00 | 12,445.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 12,045.00 | 12,145.00 | 12,245.00 | 12,345.00 | 12,445.00 |

වගුව II

**අවම මාසික වේතන ප්‍රමාණය**

අතින් වැඩ කරන කර්මාන්ත ශාලාවක් වූ විට

| කම්කරුවාගේ පන්තිය | 1 සේවා වසර රු. ශ. | 2 සේවා වසර රු. ශ. | 3 සේවා වසර රු. ශ. | 4 සේවා වසර රු. ශ. | 5 සේවා වසර රු. ශ. |
|---|---|---|---|---|---|
| "ඒ" ශ්‍රේණියේ කම්කරුවෝ (පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 12,495.00 | 12,645.00 | 12,795.00 | 12,945.00 | 13,095.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 12,495.00 | 12,645.00 | 12,795.00 | 12,945.00 | 13,095.00 |
| "බී" ශ්‍රේණියේ කම්කරුවෝ (අර්ධ පුහුණු) | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 11,995.00 | 12,120.00 | 12,245.00 | 12,370.00 | 12,495.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 11,995.00 | 12,120.00 | 12,245.00 | 12,370.00 | 12,495.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| *"සී" ශ්‍රේණියේ කම්කරුවෝ (නුපුහුණු)* | | | | | |
| (අ) විස්කෝතු සෑදීම | 11,495.00 | 11,595.00 | 11,695.00 | 11,795.00 | 11,895.00 |
| (ආ) රසකැවිලි සෑදීම | 11,495.00 | 11,595.00 | 11,695.00 | 11,795.00 | 11,895.00 |

03 - 880/11

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වෙනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 වෙනි දින දවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද එයට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය
පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තු වේ දී ය.

***උපලේඛනය***

මේස් භාණ්ඩ (හෝසියරි) නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ වූ පඩිපාලක සභාව විසින් කරන ලදුව වර්ෂ 1966 දෙසැම්බර් මස 09 වැනි දින අංක 14725 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ සහ අවසන්වරට 2013 මාර්තු මස 07 වැනි දින අංක 1800/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එහි II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

*II වැනි කොටස*

මසයකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

***I වැනි ශ්‍රේණිය***

ප්‍රධාන කම්කරුවෝ නොහොත් ප්‍රධානියෝ අංශ පරිපාලකවරු, ලේයින් මැෂින් ක්‍රියා කරවන්නෝ

***II වැනි ශ්‍රේණිය***

කියර් බොයිලේරු ක්‍රියා කරවන්නෝ, වාෂ්ප බොයිලේරු ක්‍රියා කරවන්නෝ, සෝදන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, සායම් පොවන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, ස්ටැන්ටෙක්සින් යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, මිරිකන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කැලැන්ඩර කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, වේලන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, යන්ත්‍ර මැකැනික්වරු (සාමාන්‍ය), සායම් පොවන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර මැකැනික්වරු, ස්ක්‍රීන් මුද්‍රණකරුවෝ, ස්ක්‍රීන් මුද්‍රණ ක්‍රියාකරවන්නෝ (ගැහැණු), ස්ක්‍රීන් මුද්‍රණ කරන සහායකයෝ, මහන යන්ත්‍ර මැකැනික්වරු.

*III වැනි ශ්‍රේණිය*

රෙදි අතුරන කම්කරුවෝ (ගැහැණු), කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, විදුලි බලයෙන් ක්‍රියා කරන කපන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, කපන්නෝ (අතින්), මහන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, රෙදි තම්බන කම්කරුවෝ, සුදු කරන්නෝ (පිරිමි), ගොතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, අලුත්වැඩියා කරන කම්කරුවෝ (ගැහැණු), ට්‍රීම් කරන කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (ගැහැණු), මදින කම්කරුවෝ (පිරිමි), විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, හරි වැරදි බලන කම්කරුවෝ (ගැහැණු), තෝරන කම්කරුවෝ (ගැහැණු), අසුරන්නෝ, අසුරන හා මුද්‍රා තබන කම්කරුවෝ (ගැහැණු), සපත්තු ලේස් කෝඩ් සාදන සහ වෙන් කරන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ, සෙලෝපේන් මළු සහ කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, ඔතන යන්ත්‍ර ක්‍රියාකරවන්නෝ.

*IV වැනි ශ්‍රේණිය*

ආධුනිකයෝ සහ වෘත්තිය හදාරන්නෝ (ඉහත සඳහන් වෘත්තීය හදාරන්නෝ හෝ ආධුනිකයෝ සම්බන්ධයෙන් ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත වූ කාල සීමාවන් ලෙස සැළකිය යුතුය)

**මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය**

| *සේවා වසර* | *I ශ්‍රේණිය* රු. ශ. | *II ශ්‍රේණිය* රු. ශ. | *III ශ්‍රේණිය* රු. ශ. | *IV ශ්‍රේණිය* රු. ශ. |
|---|---|---|---|---|
| 1 වසර | 11,700.00 | 11,230.00 | 10,765.00 | 6,760.00 |
| 2 වසර | 11,850.00 | 11,355.00 | 10,865.00 | |
| 3 වසර | 12,000.00 | 11,480.00 | 10,965.00 | |
| 4 වසර | 12,150.00 | 11,605.00 | 11,065.00 | |
| 5 වසර | 12,300.00 | 11,730.00 | 11,165.00 | |

03 - 880/12

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය ) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට බේකරි කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරනු බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 වන දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

බේකරි කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1958 නොවැම්බර් මස 29 වැනි දින අංක 11605 දරන *ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2013 මාර්තු මස 27 දින අංක 1803/22 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයේ වෙනස් කරන ලද්දාවූ ද, තීරණ එම උපලේඛනයෙහි II කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය

| *සේවා වර්ෂය* | *"ඒ" පන්තිය රු. ශ.* | *"බී" පන්තිය රු. ශ.* | *"සී" පන්තිය රු. ශ.* |
|---|---|---|---|
| 1 වර්ෂය | 12,215.00 | 11,310.00 | 10,405.00 |
| 2 වර්ෂය | 12,365.00 | 11,435.00 | 10,505.00 |
| 3 වර්ෂය | 12,515.00 | 11,560.00 | 10,605.00 |
| 4 වර්ෂය | 12,665.00 | 11,685.00 | 10,705.00 |
| 5 වර්ෂය | 12,815.00 | 11,810.00 | 10,805.00 |
| 6 වර්ෂය | 12,965.00 | 11,935.00 | 10,905.00 |
| 7 වර්ෂය | 13,115.00 | 12,060.00 | 11,005.00 |
| 8 වර්ෂය | 13,265.00 | 12,185.00 | 11,105.00 |
| 9 වර්ෂය | 13,415.00 | 12,310.00 | 11,205.00 |
| 10 වර්ෂය | 13,565.00 | 12,435.00 | 11,305.00 |
| 11 වර්ෂය | 13,715.00 | 12,560.00 | 11,405.00 |

03 - 880/13

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව යෝජනා කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් ද විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
සිනමා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

සිනමා කර්මාන්ත පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 මාර්තු මස, 30 වැනි දින අංක 9961 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 දින අංක 1789/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයේ I වන කොටස වෙනුවට පහත සඳහන් I කොටසෙන් දැක්වෙන සේවකයින්ගේ පන්තිය හා II සටහනෙන් දැක්වෙන අදාළ අවම මාසික වේතනය ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*I වන කොටස*

සිනමා කර්මාන්තයේ නියුක්ත පහත සේවක පන්ති වලට අදාළ කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ වන අවම මාසික වේතන ප්‍රමාණය පිළිවෙලින් මහ නගර සීමාව තුළ සිනමා ශාලාවන්ට සහ මහ නගර සීමාවෙන් පිටත සිනමා ශාලාවන්ට අදාළ වන පරිදි I වගුවෙන් සහ II වගුවෙන් දක්වා ඇත.

**සේවක පන්තිය**

*"ඒ" ලිපිකාර නොවන*

**නුපුහුණු**

ප්‍රසිද්ධ කිරීමේ කරත්ත අදින්නා, ප්‍රසිද්ධ කිරීමේ හෝ පෝස්ටර් පත්‍රකාරයා, නාන කාමර සේවක, කාර් හෝ බයිසිකල් නැවතුම්පොල සේවක, චොක්ලට්කාරයා, ක්ලීනර්, ක්ලෝක්රූම් සේවකයා, කසල ශෝධකයා, තෝට කාරයා, ගේට්ටුකාරයා, පියුන්, සැන්ඩ්විච්කාරයා, (චිත්‍රපටි) ශාලා සේවකයා, සිසිල්බීම කාරයා, ප්‍රගුණ නොවූ කම්කරුවා, අසුන් පෙන්වන්නා, අසුන් පෙන්වන්නී, වේටර්, කාවල්කාරයා (දවල්) කාවල්කාරයා (රාත්‍රී)

***අර්ධ පුහුණු***

සහකාර බාර් කීපර්, සහකාර ඇන්ජින් ඩ්‍රයිවර්, චෙකර්, කෝකි II ශ්‍රේණිය (පහළ) රිවයින්ඩර්, ටෙලිෆෝන් ඔපරේටර්, තුන්වන සහකාර ඔපරේටර්.

***පුහුණු II ශ්‍රේණිය***

සහකාර ඔපරේටර්, බාර් කීපර්, වඩු කෝකි I ශ්‍රේණිය (ඉහළ )විදුලි කාර්මික II ශ්‍රේණිය, චිත්‍රපටි කාමරය අලුත්වැඩියා කරන්නා II ශ්‍රේණිය, නොන්සිංච් ඔපරේටර්, දෙවන සහකාර ඔපරේටර්, පරිපාලන හෝ ප්‍රධාන චෙකර්, කූඩාරම් පාලක, වයර් මෑන්, ෆයර් මෑන්.

***පුහුණු I ශ්‍රේණිය***

ප්‍රධාන ඔපරේටර්, (I ශ්‍රේණිය ), ආම්චර් ඔතන්නා, විදුලි කාර්මිකයා (I ශ්‍රේණිය) ඇන්ජින් ඩ්‍රයිවර්, චිත්‍රපටි කාමර අලුත්වැඩියා කරන්නා (I ශ්‍රේණිය) කූඩාරම් සවිකරන්නා.

**"බී" ලිපිකාර**

***III ශ්‍රේණිය***

ප්‍රසිද්ධ කරන ලිපිකරු, සහකාර මුදල් භාර ලිපිකරු, යවන හා ඉවත් කරන ලිපිකරු, කලින් ආසන වෙන් කරන ලිපිකරු, ආසන වෙන් කරන ලිපිකරු

***II ශ්‍රේණිය***

ප්‍රසිද්ධ කරන කළමනාකාර, මුදල් භාර ලිපිකරු, ලිපිකරු (ගිණුම් හා සාමාන්‍ය ) ටයිප් කරන්නා, වාප්පු ලිපිකරු, ගබඩාකරු, ගණන් තබන්නා

***I ශ්‍රේණිය***

ප්‍රධාන ලිපිකරු

*අනෙක් අය*

කළමනාකරු, සහකාර කළමනාකරු

වගුව I

මහ නගර සීමාව තුළ

| | අවම මාසික වේතනය සේවා වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| සේවක පන්තිය | *1 වන වසර* | *2 වන වසර* | *3 වන වසර* | *4 වන වසර* | *5 වන වසර* |
| *ඒ ලිපිකාර නොවන* | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| නුපුහුණු | 10,177.50 | 10,277.50 | 10,377.50 | 10,477.50 | 10,577.50 |
| අර්ධ පුහුණු | 10,605.00 | 10,730.00 | 10,855.00 | 10,980.00 | 11,105.00 |
| පුහුණු II ශ්‍රේණිය | 11,200.00 | 11,350.00 | 11,500.00 | 11,650.00 | 11,800.00 |
| පුහුණු I ශ්‍රේණිය | 12,220.00 | 12,395.00 | 12,570.00 | 12.745.00 | 12,920.00 |
| *බී ලිපිකාර* | | | | | |
| III ශ්‍රේණිය | 10,605.00 | 10,730.00 | 10,855.00 | 10,980.00 | 11,105.00 |
| II ශ්‍රේණිය | 11,165.50 | 11,315.00 | 11,465.00 | 11,615.00 | 11,765.00 |
| I ශ්‍රේණිය<br>ප්‍රධාන ලිපිකාර | 11,875.00 | 12,050.00 | 12,225.00 | 12,400.00 | 12,575.00 |
| *අනෙක් අය* | | | | | |
| කළමණාකරු | 12,640.00 | 12,815.00 | 12,990.00 | 13,165.00 | 13,340.00 |
| සහකාර කළමණාකරු | 11,040.00 | 11,190.00 | 11,340.00 | 11,490.00 | 11,640.00 |

වගුව II

මහ නගර සීමාවෙන් පිටත

| | අවම මාසික වේතනය සේවා වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| සේවක පන්තිය | *1 වන වසර* | *2 වන වසර* | *3 වන වසර* | *4 වන වසර* | *5 වන වසර* |
| *ඒ ලිපිකාර නොවන* | *රු. ශ.* | *රු. ශ* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| නුපුහුණු | 10,265.00 | 10,365.00 | 10,465.00 | 10,565.00 | 10,665.00 |
| අර්ධ පුහුණු | 10,690.00 | 10,815.00 | 10,940.00 | 11,065.00 | 11,190.00 |
| පුහුණු II ශ්‍රේණිය | 11,280.00 | 11,430.00 | 11,580.00 | 11,730.00 | 11,880.00 |
| පුහුණු I ශ්‍රේණිය | 12,300.00 | 12,475.00 | 12,650.00 | 12,825.00 | 13,000.00 |
| *බී ලිපිකාර* | | | | | |
| III ශ්‍රේණිය | 10,690.00 | 10,815.00 | 10,940.00 | 11,065.00 | 11,190.00 |
| II ශ්‍රේණිය | 10,690.00 | 10,840.00 | 10,990.00 | 11,140.00 | 11,290.00 |
| *I ශ්‍රේණිය*<br>ප්‍රධාන ලිපිකාර | 11,655.00 | 11,830.00 | 12,005.00 | 12,180.00 | 12,355.00 |
| *අනෙක් අය* | | | | | |
| කළමණාකරු | 12,425.00 | 12,600.00 | 12,775.00 | 12,950.00 | 13,125.00 |
| සහකාර කළමණාකරු | 10,780.00 | 10,930.00 | 11,080.00 | 11,230.00 | 11,380.00 |

03 - 880/14

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තිරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 වන දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

*උපලේඛනය*

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9971 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට අංක 1838/26 සහ 2013.11.27 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් වෙනස් කරනු ලැබූවා වූ ද, තීරණ පහත සඳහන් අයුරුත් තවදුරටත් වෙනස් කළ යුතුය.

(1) එම උපලේඛනයේ II වන කොටසේ කැලි මිම්මේ සේවකයන්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් මෙසේය.

| | *කාර්යය* | *පඩි ප්‍රමාණය<br>රු. ශ.* |
|---|---|---|
| (1) | වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම - ගස් 100 ක් සඳහා | රු. 1,950.00 |
| (2) | කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම - ගෙඩි 1000ක් සඳහා කෝප්පරා වේලීම සහ තේරීම | රු 572.00 |

*III කොටස*

(2) *කාර්යයන් :*

(අ) පොල් වැවිල්ලක් වගා කිරීම හා පවත්වාගෙන යාම
(ආ) කොප්පරා සෑදීම

ඉහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණයන් වන්නේ
සියලු කම්කරුවන් සඳහා දිනකට - රු 490.00

ගවපාලනයේ නිරත යම් සේවකයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුත්තේ , මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධි කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කරන සාමාන්‍ය දවසකට එබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

III "ඒ " වන කොටස

(අ) කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට

(ආ) මුරකරුවෙකුගේ වැඩ වලට

අදාළ කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ :

| අක්කර ප්‍රමාණය | | මුරකරු | කොන්දොස්තර |
|---|---|---|---|
| (1) අක්කර 10ට නොඅඩු එහෙත් අක්කර 25 ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | රු. 11,232.50 | අදාළ නැත |
| (2) අක්කර 25ට නොඅඩු එහෙත් අක්කර 50කට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | රු. 11,722.50 | රු. 12,050.00 |
| (3) අක්කර 50ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | රු 13,435.00 | රු. 13,760.00 |

03 - 880/15

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස කිරීමට ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2015 අප්‍රේල් මස 02 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, ඒ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයන්ද ඒ අඩංගු විය යුතු ය.

හේරත් යාපා,
සභාපති,
ඇඳුම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2015 මාර්තු මස 11 දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දීය.

*උපලේඛනය*

ඇඳුම් සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1966 මාර්තු මස 25 වැනි දින අංක 14688 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන්වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූද, උපලේඛනයේ හි II වැනි කොටස වෙනුවට පහත සඳහන් නව කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*II වැනි කොටස*

*මසකට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

***කම්කරුවන්ගේ පන්තිය***

*I (අ) වැනි ශ්‍රේණිය* :
මෝස්තරකරුවෝ හෝ ඩිසයිනර්වරු, ඇඳුම් මසන්නෝ, ඩිසයින් පන්ච් කරන්නෝ, ඩිස්කට් සකසන්නෝ

*(ආ) වැනි ශ්‍රේණිය* :
ප්‍රධානීන් නොහොත් අංශ පරිපාලකවරු

*II වැනි ශ්‍රේණිය* :
ඇඳුම් කපන්නෝ (අතින්) ඇඳුම් කපන්නෝ, යන්ත්‍ර අළුත් වැඩියා කරන්නෝ, අවසාන වරට හරි වැරදි බලන්නෝ

*III වැනි ශ්‍රේණිය* :
හරි වැරදි බලන්නෝ සහ තෝරන්නෝ, රෙදි මදින කම්කරුවෝ, විවිධ වැඩ කරන (ගැහැණු) කම්කරුවෝ, මුද්‍රා තබන (ගැහැණු) කම්කරුවෝ, රෙදි මදින්නෝ (ගැහැණු) මහන යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, විදුලි බලයෙන් රෙදි මදින යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ, නිකුත් කරන (ගැහැණු) කම්කරුවෝ, මැෂින්/අතින් එම්බ්‍රොයිඩර් කරන්නෝ

*IV වැනි ශ්‍රේණිය* :
රෙදි අතුරන්නෝ (පිරිමි), රෙදි අතුරන්නෝ (ගැහැණු), අසුරන්නෝ, සෙලෝපේන් මලු හා කාඩ්බෝඩ් පෙට්ටි සාදන්නෝ, නුපුහුණු කම්කරුවෝ, ගබඩා කම්කරුවෝ

*V වැනි ශ්‍රේණිය* :
ආධුනිකයන් හා පුහුණුවන්නන්

ඉහත සඳහන් යම් වෘත්තිය ආධුනිකයකුගේ හෝ පුහුණුවන්නකුගේ ආධුනික කාලය වැඩ කරන දින 156 කින් යුක්ත විය යුතු ය.

**වේතන ප්‍රමාණය**

| *සේවා වර්ෂය* | *I(ඒ) ශ්‍රේණිය* | *I(බී) ශ්‍රේණිය* | *II ශ්‍රේණිය* | *III ශ්‍රේණිය* | *IV ශ්‍රේණිය* | *V ශ්‍රේණිය* |
|---|---|---|---|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 1 සේවා වර්ෂය | 12,110.00 | 11,660.00 | 10,495.00 | 10,435.00 | 9,920.00 | 6,555.00 |
| 2 සේවා වර්ෂය | 12,310.00 | 11,835.00 | 10,645.00 | 10,560.00 | 10,020.00 | |
| 3 සේවා වර්ෂය | 12,510.00 | 12,010.00 | 10,795.00 | 10,685.00 | 10,120.00 | |
| 4 සේවා වර්ෂය | 12,710.00 | 12,185.00 | 10,945.00 | 10,810.00 | 10,220.00 | |
| 5 සේවා වර්ෂය | 12,910.00 | 12,360.00 | 11,095.00 | 10,935.00 | 10,320.00 | |

03 - 880/16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.